1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எமது இல. / My Ref. CSS/03/06/ANN.TR/2026 ඔබේ අංකය / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2026.10.16

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**2026 වාර්ෂික ස්ථාන මාරු**
**පළාත් පාලන ආයතන වල ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි**

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක GS/SP/3/3/TR/25/IV හා 2026.10.16 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පළාත් පාලන ආයතන වල රාජකාරි කරනු ලබන නිලධාරීන්ගේ ස්ථාන මාරු වර්ෂ අවසානයේ සිදු කිරීම හේතුවෙන්, එම වර්ෂයේ සංවර්ධන ක්‍රියාවලින් වල රාජකාරි කටයුතු, ගිණුම් පියවීම් කටයුතු ඇතුළු රාජකාරි කටයුතු දෙසැම්බර් 31 ට අවසන් කළ යුතුව ඇති බැවින්, එම පළාත් පාලන ආයතන ප්‍රධානීන් පරිපාලන හා කළමනාකරණ ගැටළු වලට මුහුණ දී ඇති බව, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත වාර්තා වී ඇති බව සඳහන් කර ඇත.

03. එබැවින්, එම ගැටළුව පිළිබඳ විශේෂ අවධානය යොමු කර එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම 2027.01.15 වන දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා නියෝග ලබා දී ඇත.

04. එබැවින්, ඔබ ආයතනයෙහි වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග සමඟ පළාත් පාලන ආයතන වල නිලධාරීන් සම්බන්ධ වේ නම් එම ආයතන වලින් විමසීම් සිදු කර ඔවුන්ගේ නිදහස් වීමේ දිනය සලකා බලා ඔබගේ ආයතනයේ නිලධාරීන් ද නිදහස් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

රතිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

අත් / කළේ : චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2222603
කාර්යාලය / அலுவலகம் / Office 091 4119011, 091 2234052
091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk
එස්.එච්. දහනායක මාවත, ගාල්ල. S.H. Dahanayaka Mawatha, Galle. எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"ඩිජිටල් නවෝත්පාදනයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක්"